# <u>ප්‍රසම්පාදන දැන්වීමයි</u>

## <u>දකුණු පළාත් සභාව</u>
## <u>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා කාර්යාලය</u>
## <u>කොටුව - ගාල්ල</u>

ගාල්ල, කොටුව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ, සභාපති, ප්‍රසම්පාදන කමිටුව (නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)) විසින් පහත සඳහන් වැඩ විෂය සඳහා **2020-07-23** දින පෙ.ව. **10.30** දක්වා මුද්‍රා තබන ලද ලංසු පත් බාරගනු ලැබේ. **2020-07-23** පෙ.ව. **10.30** ට මෙම කාර්යාලයේදී ලංසුකරුවන් ඉදිරියේදී ලංසු පත් විවෘත කරනු ලැබේ.

| විස්තරය | අවශ්‍ය ලියාපදිංචිය | ආපසු ගෙවන ලංසු ඇපකරය රු. | ආපසු නොගෙවන ලංසු තැන්පත් රු. | ටෙන්ඩර් පත් ලබා ගත හැකි දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය |
|---|---|---|---|---|
| 1. මහමෝදර රුහුණු රන්සළු ආයතන පරිශ්‍රය සඳහා නව සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම (III අදියර) | **C4 / C5** | **345,000 /-** | **3500/-** | ගාල්ල |

**02.** ලංසු පත් **2020-07-22** දින ප.ව. **2.30** දක්වා අදාල දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැක. ඉහත දක්වා ඇති අවශ්‍ය ලියාපදිංචිය සපුරා ඇති "ශ්‍රී ලංකා ඉදිකිරීම් අභ්‍යාස සහ පුහුණු සංවර්ධන ආයතනයේ" ගොඩනැගිලි ක්ෂෙත්‍රය සඳහා ලියාපදිංචි ඇති හෝ දකුණු පළාත් සභාව යටතේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ට මෙම කොන්ත්‍රාත්තු පවරනු ඇත.

**03.** ලංසු සම්බන්ධ වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හිදී සාමාන්‍ය කාර්යාල වේලාව තුල අදාල දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයෙන් ලබාගත හැක. අදාල දුරකතන අංකය පහත දැක්වේ.

දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය ගාල්ල - **091-2246160**

**04.** ඉදිරිපත් කරනු ලබන ලංසු බහාලන කවරයේ වම්පස උඩ කෙලවරේ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුය. සම්පූර්ණ කරන ලද ලංසු පත් පිටපත් දෙකකින් යුක්තව පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය තුලට බහාලිය හැක. නියමිත වේලාවට පසුව ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසුපත් විවෘත කරන අවස්ථාවේදී ලංසු ඉදිරිපත් කරන්නන් හෝ ඔහු වෙනුවෙන් බලය පවරන ලද නියෝජිතයන්ට පැමිණ සිටීමට ඉල්ලීමක් කරනු ලැබේ. මිල ගණන් අසම්පූර්ණ ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසු ඇප මුදලද රාජ සන්තක කරනු ලැබේ. ලංසුපත් ඉදිරිපත් නොකරන ලංසුකරුවන්ගේ ලංසු ඇප මුදල්ද රාජ සන්තක කරනු ලැබේ.

**05.** ඉහත කර්මාන්තයට අදාල ලංසු සුරක්‍ෂණ ගාස්තු දිස්ත්‍රික් කාර්යාලය වෙත මුදලින් ගෙවීම හෝ රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ **5:3:13** ආකෘතියේ පරිදි ශ්‍රී ලංකා මහා බැංකුව මගින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබාගත් අදාල වටිනාකමින් යුත් ඇපකරයක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) නමින් ඉදිරිපත් කිරීම කල යුතුය. මුදලින් ගෙවන්නේ නම් ලදු පතේ ඡායා පිටපතක් ලංසුපත් සමග ඉදිරිපත් කල යුතුය. ලංසු ඇපකර වලංගු කාලය **2020-07-23** සිට **2020-11-24** දක්වා විය යුතුය.

**06.** ලංසුවල වලංගු කාලය මාස **3** කි.

**07**. සෑම මිළ ගණන් ඇතුලත් ලංසු පතකම ඒකක මිළ ගණන් හා මුළු මුදල දැක්වෙන තීරය හා සාරාංශය (වට්ටම දැක්වෙන තීරයද ඇතුලත්ව) අවර්ණ **(transparent)** සෙලෝටේප් කර ඉදිරිපත් කළ යුතුය.

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)
දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය
කොටුව - ගාල්ල
**2020-07-02**